**කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

*දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය*

**වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය**

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධි පළමු පරීක්ෂණය (බාහිර) - 2023

මැයි - 2025

## BMGT E 1035 - ව්‍යාපාර ආර්ථික විද්‍යාව

කාලය : පැය 03 යි

**උපදෙස්:**

- මෙම ප්‍රශ්න පත්‍රය A කොටස, B කොටස සහ C කොටස යනුවෙන් කොටස් තුනකින් සමන්විතය.
- A කොටස අනිවාර්ය බහුවරණ ප්‍රශ්න 20 කින් සමන්විත වේ. එම ප්‍රශ්න සඳහා වඩාත්ම යෝග්‍ය පිළිතුර තෝරාගෙන එය අදාල පිළිතුරු පොත් පිංචෙහි ලියන්න.
- B කොටසෙහි හා C කොටසෙහි රචනා ශෛලිය ප්‍රශ්න හයක් (06) ඇතුලත්ය.
- B කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් (02) සහ C කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න එකක් (01) තෝරාගෙන ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.
- ජංගම දුරකථන, ස්මාර්ට් පරිගණක හෝ වෙනත් අංකිත උපාංගයන් භාවිතා කිරීම තහනම් වේ.
- ගණක යන්ත්‍ර භාවිතයට ඉඩදෙනු ලැබේ.
- මුළු ලකුණු 100.

### A කොටස

(01) ඉල්ලුම් නීතිය අනුව, අනෙකුත් සාධක ස්ථාවරව පවතිද්දී, මිල අඩුවන විට,

අ) ඉල්ලුම් ප්‍රමාණය අඩුවෙයි.

ආ) සැපයුම් ප්‍රමාණය වැඩිවෙයි.

ඇ) ඉල්ලුම් ප්‍රමාණය වැඩිවෙයි.

ඈ) සැපයුම් ප්‍රමාණය අඩුවෙයි.

(02) පාරිභෝගිකයෙකුගේ ආදායම් ඉල්ලුම් නම්‍යතාවය 2.0 කි. ඔහුගේ ආදායම 10% කින් ඉහළ ගියහොත්, එම භාණ්ඩය සඳහා ඇති ඉල්ලුමේ අපේක්ෂිත ප්‍රතිශතක වෙනස්වීම කීයද?

අ) 10%

ආ) 15%

ඇ) 20%

ඈ) 25%

(03) උපේක්ෂා වක්‍රයක් මඟින් දැක්වෙන්නේ,

අ) පාරිභෝගිකයෙකුට මිලදී ගත හැකි භාණ්ඩ

ආ) සමාන උපයෝගිතාවයක් ලබාදෙන භාණ්ඩ සංයෝජන

ඇ) ආදායම් වෙනස්කම්

ඈ) ආයතනයක නිෂ්පාදන හැකියාව.

(04) හීනවන ආන්තික ඵලදා නීතියෙහි තේරුම වන්නේ,

අ) මුළු නිෂ්පාදනය හැමවිටම අඩුවෙයි.

ආ) වැඩි යෙදවුම් යෙදීමෙන් හැමවිටම වැඩි නිෂ්පාදනයක් ලැබෙයි

ඇ) යම් අවස්ථාවකින් පසුව අමතර යෙදවුමෙන් අඩු නිෂ්පාදනයක් ලැබෙයි.

ඈ) ආන්තික පිරිවැය හැමවිටම අඩුවෙයි.

(05) සමාගමක නිෂ්පාදනය ශුන්‍ය වන විට සමස්ත නිෂ්පාදන වියදම රු. 500 ක් වේ. ඒකක 10 ක් නිෂ්පාදනය කරන විට සමස්ත නිෂ්පාදන වියදම රු. 2000 ක් වේ. ඒකක 10 ක් නිෂ්පාදනය කරන විට සාමාන්‍ය විචල්‍ය වියදම ගණනය කරන්න.

අ) රු. 100

ආ) රු. 150

ඇ) රු. 200

ඈ රු. 250

(06) සාමාන්‍ය පිරිවැය අඩුවෙන විට ආන්තික පිරිවැය

අ) සාමාන්‍ය පිරිවැයට සමාන වේ

ආ) සාමාන්‍ය පිරිවැයට වඩා වැඩිය

ඇ) සාමාන්‍ය පිරිවැයට වඩා අඩුයි

ඈ) ස්ථාවර වේ.

(07) ආර්ථික විද්‍යාවේ සම පිරිවැය (ISO – Cost) රේඛාවක් මඟින් නියෝජනය කරන්නේ කුමක්ද?

අ) එකම ප්‍රතිදාන මට්ටමක් ලබා දෙන ආදාන සංයෝජන

ආ) එකම පිරිවැයක් යටතේ වැයවන විවිධ ආදාන සංයෝජන

ඇ) දී ඇති පිරිවැයකදී ලබා ගත හැකි උපරිම ප්‍රතිදානය

ඈ) එකම පිරිවැයකදී ඇති විවිධ ප්‍රතිදාන

(08) සාමාන්‍ය පිරිවැය යනු කුමක්ද?

අ) මුළු පිරිවැය/ ආන්තික පිරිවැය

ආ) ආන්තික පිරිවැය/ මුළු පිරිවැය

ඇ) මුළු පිරිවැය/ නිෂ්පාදිත ඒකක ගණන

ඈ) මුළු ආදායම/ මුළු පිරිවැය

(09) ආන්තික වියදම යනු,

අ) මුළු වියදම, ප්‍රමාණයෙන් බෙදූවිට ලැබෙන ප්‍රමාණයයි.

ආ) තවත් ඒකකයක් නිෂ්පාදනය කිරීමේ වියදමයි.

ඇ) සියලු ඒකකවල සාමාන්‍ය වියදමයි.

ඈ) ස්ථාවර පිරිවැය

(10) පූර්ණ තරගකාරී ආයතනයක් මුහුණ දෙන ඉල්ලුම් වක්‍රය පූර්ණ නම්‍ය ඉල්ලුම් වක්‍රයක් වන්නේ,

අ) වෙළඳ පොලේ සමජාතීය භාණ්ඩ අලෙවිකරණ බැවිනි

ආ) සැපයුම්කරු මිල තීරණය කරන්නකු බැවිනි

ඇ) සැපයුම්කරු මිල ගනුවකු බැවිනි

ඈ) සැපයුම්කරුට අවශ්‍ය තොරතුරු නොලැබෙන බැවිනි

(11) පූර්ණ තරගකාරී වෙළඳපොලක ඉල්ලුම් වක්‍රය $QD = 10 - P$ වේ. වෙළඳපොල සැපයුම් වක්‍රය $QS = 2 + 3P$ වේ. වෙළඳපොල සමතුලිත තත්ත්වයට පත්වනුයේ,

අ) $P = 3, Q = 7$

ආ) $P = 2, Q = 8$

ඇ) $P = 4, Q = 8$

ඈ) $P = 5, Q = 5$

(12) කුමන වෙළඳපොල ව්‍යුහයකදී "මිල නායකත්වය" සංකල්පය දක්නට ලැබේද?

අ) පූර්ණ තරඟකාරී වෙළඳපොල

ආ) ඒකාධිකාරී තරඟ

ඇ) කතිපයාධිකාරී

ඈ) ඒකාධිකාරී

(13) ඒකාධිකාරී ආයතනයක් ඒකක 10,000 නිෂ්පාදනය කරමින්, රු. 20 කට එක් ඒකකයක් විකුණනු ලබයි. එහි ආන්තික ආදායම රු.10 ක් හා ආන්තික වියදම රු. 9 ක් වේ. ඒකාධිකාරී ආයතනයක් කලයුතු ක්‍රියාව කුමක්ද?

අ) ලාභය වැඩි කිරීමට නිෂ්පාදන ප්‍රමාණය වැඩි කළ යුතුය.

ආ) ලාභය වැඩි කිරීමට නිෂ්පාදන ප්‍රමාණය අඩු කළ යුතුය.

ඇ) අලාභ ඇතිවීම නිසා නිෂ්පාදනය නවතා දැමිය යුතුය.

ඈ) ලාභ උපරිම කරන මට්ටමේදී නිෂ්පාදනය එලෙසම පවත්වාගැනීම කළ යුතුය.

(14) කතිපයාධිකාරී වෙළඳපොල ව්‍යුහයකදී,

අ) මිලදී ගන්නන් දෙදෙනෙක් පමණි.

ආ) වෙළඳපොලේ ප්‍රබලත්වය හසුරවනුයේ විශාල සමාගම් කිහිපයකි.

ඇ) භාණ්ඩ සැමවිටම සමජාතීය වේ.

ඈ) නව සමාගම්වලට වෙළඳපොළට පිවිසීම පහසුය.

(15) ආදායමේ චක්‍රීය ප්‍රවාහයෙන් මුදල් ගැලීමක් වන්නේ,

අ) ව්‍යාපාරයක් විසින් ගෘහස්තයන්ට ගෙවන වැටුප්

ආ) රජය සඳහා භාණ්ඩ ගලායාම්

ඇ) කර්මාන්තශාලා වෙත අමුද්‍රව්‍ය ගලායාම

ඈ) සේවකයින්ගෙන් සමාගම් වෙත සේවා ගලාඒම

(16) ලී බඩු සමාගමක් රු. 3,000 ක් වටිනා ලී හා රු. 500 ක් වටිනා ඇණ මිලදී ගන්නා ලදී. මේ අනුව මේසයක් රු. 7,000 කට විකිණීමෙන් එය දළදේශීය නිෂ්පාදිතයට දක්වන දායකත්වය කීයද?

අ) රු. 3,500

ආ) රු. 4,000

ඇ) රු. 7,000

ඈ) රු. 10,500

(17) රටක නාමික දළ දේශීය නිෂ්පාදනයේ වර්ධන වේගය 10% ක් හා මූර්ත දළ දේශීය නිෂ්පාදන වර්ධනය 6% ක් නම්, මෙරට උද්ධමන අනුපාතය කීයද?

අ) 4%

ආ) 6%

ඇ) 16%

ඈ) 10%

(18) කේන්සියානු සරල ආකෘතියට අනුව ආයෝජන වියදම වැඩි වීමෙන් සමාහාර ඉල්ලුම් රේඛාව ---------------- වෙත විතැන් වන අතර, IS වක්‍රය ------------ මාරු වේ.

අ) පහළට, වමට

ආ) ඉහළට, දකුණට

ඇ) පහළට, දකුණට

ඈ) ඉහළට, වමට

(19) උද්ධමනය පාලනය කිරීමේදී මහ බැංකුව විසින් මුහුණදෙන ප්‍රධාන අභියෝගය කුමක්ද?

අ) පොලී අනුපාතය සමඟ උද්ධමනය පාලනය කිරීම පහසුවීම.

ආ) එය ආර්ථික වර්ධනය වැඩිදියුණුව සහ උද්ධමනය පාලනය අතර සමාන කිරීම කළ යුතුය.

ඇ) උද්ධමනය පාලනය කෙරෙහි පමණක් අවධානය යොමු කරමින් වර්ධනය නොසලකා හැරීම.

ඈ) බාහිර සාධකයක් පිළිබඳ සැලකිලිමත් නොවීම.

(20) ආර්ථික පසුබෑමක් තුළ සේවා වියුක්තිය වර්ධනය වීමක් නිසා ඇතිවිය හැකි ප්‍රතිවිපාකයක් වන්නේ,

අ) ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය පහළ බැසීම

ආ) ආර්ථික පසුබැසීමකදී වැඩි පිරිසක් රැකියා සෙවීම

ඇ) ආර්ථික වර්ධනයේදී සේවා වියුක්තිය ඉහළයාමේ නැඹුරුවක් තිබීම

ඈ) ආර්ථික පසුබෑමක් තුළදී සේවා වියුක්තිය ඉහළයාම සාමාන්‍යයෙන් කෙටිකාලයක් සඳහා පමණක් වීම

**(මුළු ලකුණු 01 x 20 = 20)**

## B කොටස

**ප්‍රශ්න අංක 01**

අ) "ආර්ථික විචල්‍යයන් අතර සම්බන්ධතා තේරුම් ගැනීම සඳහා සූක්ෂම සහ සාර්ව විශ්ලේෂණය ස්ථිතික සහ ගතික විශ්ලේෂණය තරම්ම වැදගත් වේ." මෙය උදාහරණ සමඟ පැහැදිලි කරන්න.

(ලකුණු 07)

ආ) උපකල්පිත ආර්ථිකයක සහල් සැපයුම් කාලසටහන පහත පරිදි වේ.

| **මිල (රු.)** | **සපයන ලද ප්‍රමාණය (කිලෝග්‍රෑම්)** |
|---|---|
| 50 | 0 |
| 60 | 150 |
| 70 | 300 |
| 80 | 450 |
| 90 | 600 |

සැපයුම් ශ්‍රිතය පහත ආකාරයෙන් වේ. $Qs = a + bP$

(i) b හි අගය සොයන්න.

(ii) a හි අගය සොයන්න.

(iii) සමීකරණයට අගයන් ආදේශ කරන්න.

(ලකුණු 07)

ඇ) මිල ඉල්ලුම් නම්‍යතාවය පිළිබඳ සංකල්පය පැහැදිලි කර මිල වෙනස්වන විට එය සමාගමක ආදායමට බලපාන ආකාරය සාකච්ඡා කරන්න.

(ලකුණු 06)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 02**

පහත වගුවේ දක්වා ඇත්තේ රාණි දිනකට චොකලට් පරිභෝජනය කිරීමෙන් ලබාගන්නා සමස්ත උපයෝගීතාව (Total Utility) වේ.

ඇ)    ආන්තික උපයෝගීතාව (Marginal Utility) සඳහා අගයන් පුරවන්න.

| චොක්ලට් ඒකක (units) | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 |
|---|---|---|---|---|---|---|---|---|
| TU (මුළු උපයෝගිතා ඒකක) | 50 | 90 | 120 | 140 | 150 | 155 | 157 | 156 |
| MU (ආන්තික උපයෝගිතා ඒකක) | | | | | | | | |

(ලකුණු 04)

ආ)    ඉහත අගයන් ප්‍රස්ථාර සටහනක නිරූපණය කර TU සහ MU අතර සම්බන්ධතාවය කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ඇ)    රූප සටහන් භාවිතයෙන් පාරිභෝගික සමතුලිතතාවය සහ නිෂ්පාදන සමතුලිතතාවය අතර වෙනස හඳුනාගන්න.

(ලකුණු 08)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 03**

ඇ)    හීනවන ආන්තික ඵලදා නීතිය සහ පරිමානානුකූල ඵල සංකල්පයන් සමාගමක පිරිවැය ව්‍යුහයට බලපාන්නේ කෙසේද යන්න පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ආ)    "නිෂ්පාදන ශ්‍රිතය මගින් යෙදවුම් හා නිමවුම් අතර පවතින සම්බන්ධතාවය නිරූපණය කරයි. කෙටි කාලපරිච්ඡේදයකදී අවම වශයෙන් එක් යෙදවුමක්වත් ස්ථාවර වන අතර ආයතනයකට තම නිෂ්පාදනය ඉහළ දැමිය හැකිවන්නේ විචල්‍ය නිෂ්පාදන සාධක යෙදවුම් ප්‍රමාණය වැඩිකිරීමෙන් පමණි." ශ්‍රමික යෙදවුම් ප්‍රමාණය වැඩි කිරීමෙන් සමස්ත නිමවුමට වන බලපෑම පිළිබඳව රූප සටහන් යොදා ගනිමින් පැහැදිලි කර ප්‍රශස්ත නිෂ්පාදන පරාසය දක්වන්න.

(ලකුණු 07)

ඇ)    "ඒකාධිකාරියක් අඩු ප්‍රතිදානයක් නිපදවන අතර පූර්ණ තරඟකාරිත්වය යටතේ ඇති මිලට වඩා ඉහළ මිලක් අය කරයි." පැහැදිලි කිරීමට රූප සටහනක් භාවිතා කරන්න.

(ලකුණු 07)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 04**

අ) පූර්ණ තරඟකාරිත්වය සහ ඒකාධිකාරී තරඟය යටතේ ඉල්ලුම් වක්‍රයන් සංසන්දනය කරන්න. ඒවායන්හි බෑවුම සහ නම්‍යතාවයන් වෙනස්වන්නේ මන්දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ආ) අනෙකුත් වෙළඳපොළවල් හා සසඳන කල කතිපයාධිකාරී වෙළඳපොලක දක්නට ලැබෙන කැපී පෙනෙන ලක්ෂණයන් මොනවාද?

(ලකුණු 03)

ඇ) සාමාන්‍ය විචල්‍ය පිරිවැය ආවරණය කළ නොහැකි විට පූර්ණ තරඟකාරී සමාගමක් කෙටි කාලයේදී වසා දැමිය යුත්තේ මන්දැයි ප්‍රස්ථාරයක් සමඟ පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ඈ) සමාගමක ඉල්ලුම සහ පිරිවැය ශ්‍රිතය වන්නේ,

- ඉල්ලුම : $P = 180 - 3Q$
- මුළු පිරිවැය : $TC = 40 + 2Q^2$

(i) ලාභය උපරිමකරන ප්‍රමාණය සහ මිල ගණනය කරන්න.

(ii) ලාභය/ අලාභය තීරණය කරන්න.

(ලකුණු 06)

**(මුළු ලකුණු 20)**

## C කොටස

**ප්‍රශ්න අංක 05**

අ) සාර්ව ආර්ථික විද්‍යා විචල්‍යයන්ගේ වෙනස්වීම කළමනාකරණ තීරණ ගැනීමට බලපාන්නේ කෙසේද? ඔබගේ පිළිතුර සනාථ කිරීමට අවශ්‍ය උදාහරණ සපයන්න.

(ලකුණු 10)

ආ) පහත සඳහන් මාතෘකාවන්ට අදාලව වර්තමාන ස්වරූපය සහ ශ්‍රී ලංකා ආර්ථිකයට එහි එකිනෙකෙහි බලපෑම සාකච්ඡා කරන්න.

(i) ශ්‍රී ලංකාවේ උද්ධමනය සහ සේවා වියුක්තිය

(ii) ශ්‍රී ලංකා ආර්ථික වර්ධනය සහ ආර්ථික සංවර්ධනය

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

**ප්‍රශ්න අංක 06**

අ) ජාතික ආදායම යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? ජාතික ආදායම ගණනය කිරීමේ ප්‍රධාන ක්‍රම පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ආ) ආර්ථික යහපැවැත්ම මැනීම සඳහා ආර්ථික විද්‍යාඥයින් නාමික දළ දේශීය නිෂ්පාදිතයට වඩා මූර්ත දළ දේශීය නිෂ්පාදිතය භාවිතා කරන්නේ ඇයි?

(ලකුණු 04)

ඇ) ජාතික ආදායම මැනීමේ වැදගත්කම් තුනක් දක්වන්න.

(ලකුණු 05)

ඈ) උපකල්පිත ආර්ථිකයකට අදාලව පහත තොරතුරු සපයා ඇත. (සංඛ්‍යා රුපියල් මිලියන වලිනි.)

| | |
|---|---|
| $C = 100 + 0.8yd$ | (පරිභෝජන ශ්‍රිතය) |
| $I = 200$ | (ස්වායත්ත ආයෝජන) |
| $G = 100$ | (රාජ්‍ය වියදම) |
| $T = 45 + 0.2y$ | (බදු ආදායම්) |
| $Tr = 50$ | (සංක්‍රාම ගෙවීම්) |

(i) පරිභෝජන ශ්‍රිතයට අදාලවන ඉතුරුම් ශ්‍රිතය ලියා දක්වන්න.

(ලකුණු 02)

(ii) දී ඇති තොරතුරු පදනම් කරගෙන ජාතික ආදායම් සමතුලිතය ගණනය කරන්න.

(ලකුණු 04)

**(මුළු ලකුණු 20)**